දිවයින

# දේශපාලනයේ මෙතෙක් කතාව

2007 මාර්තු මස 19 වැනිදා සඳුදා 

## අතීතය පිස එන සුවඳ...



### දේශපාලන අතීතය පිස එන මතක වත

දේශපාලනයේ මෙතෙක් කතාවට ඔබගේ අතීත දේශපාලන මතක සැමරුම් පොත්පත්, ඡායාරූප, ලිපි එවන්න.

අපේ ලිපිනය -
දේශපාලනයේ මෙතෙක් කතාව
"දිවයින"
අංක 223, බ්ලූමෙන්ඩල් පාර,
කොළඹ 13.
manojabaya@yahoo.com

සංස්කරණය - **මනෝජ් අබයදීර**

# රට දැය සමය වෙනුවෙන් තනතුරු නොතකා දේශපාලනය කළ

# පනස් හයේ පියා

# එල්. එච්. මෙත්තානන්ද

◆ පූජ්‍ය මැදගම ධම්මානන්ද හිමි
මහනුවර අස්ගිරි මහා විහාරවාසී

**අද දිනට යෙදෙන එල්. එච්. මෙත්තානන්දයන්ගේ උපන් දින ගුණ සමරුව නිමිත්තෙනි**

තමන්ගේ රටට, ජාතියට හා ආගමට සිදුවන විනාශය පිළිබඳව හැඟීම්බරව කතා කරන සහ ඒවායේ ආරක්ෂාව සඳහා දැඩි අදිටනින් කටයුතු කරන පුද්ගලයන්ට ජාතිවාදියා, නැතිනම් අන්තවාදියා යනුවෙන් ඇතැම්මු චෝදනා කරති. එහෙත් ජාතිහිතෛෂී පුද්ගලයෝ ඒ නින්දා අපහාසවලින් නොසැලී යථාර්ථය තේරුම් ගෙන තමන්ගේ ජාතික හා ආගමික වගකීම ඉටු කරති. එල්. එච්. මෙත්තානන්ද මහතා ඒ ගණයට වැටෙන පුද්ගලයෙකි.

එල්. එච්. මෙත්තානන්ද මහතා උපන්නේ 1894 මාර්තු 19 වැනි දින අම්බලන්ගොඩ කලුමඩුමුල්ලේ දීය. කඩුගන්නාවේ වෙළෙඳ ව්‍යාපාරිකයකු වූ ලොකුසතු හේවගේ තෝමස් ද සිල්වා මහතා ඔහුගේ පියතුමා ය. වීරසූරිය කර්ලිනාහාමි මහත්මිය ඔහුගේ මෑණියෝ ය. අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයෙන් සහ ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලද මෙත්තානන්ද මහතා ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධිය හිමිකර ගත්තේය. 1920 දී ගුරු සේවයට පිවිසි ඔහු මහනුවර ධර්මරාජ විද්‍යාලයේ සහ කොළඹ ආනන්ද විද්‍යාලයේ විදුහල්පති තනතුරු දැරීමෙන් පසු, 1954 දී විශ්‍රාම ලැබුවේය. මෙත්තානන්ද මහතාගේ සේවා කාලය තුළ රටට, දැයට හිතැති සිසු පරපුරක් බිහි වූ අතර, ධර්මරාජ සහ ආනන්දය බෞද්ධ අනන්‍යතාවකින් යුත් කීර්තිමත් විද්‍යායතන බවට පත්විණි.

යටත් විජිත පාලනය යටතේ අපේ රට තුළ නිර්මාණය වී තිබුණ අන්‍යාගමික හා විජාතික බලවේග සිඳ බිඳ දමා පොදු ජන යුගයක් බිහිකිරීමට මෙත්තානන්ද මහතා සිදුකළ මෙහෙවර අති විශාලය. ඔහු 1956 දේශපාලන පෙරළියට පසුබිම සැකසූ ප්‍රධාන පුද්ගලයෙකි. 1956 මැතිවරණයේදී එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාට ආණ්ඩු බලය ලබා දුන් ප්‍රතිපත්ති ප්‍රකාශන සැකසූණේ මෙත්තානන්ද මහතා සාමාජිකත්වය දැරූ බෞද්ධ තොරතුරු පරීක්ෂණ සභාවේ වාර්තාව අනුව ය. 2500 බුද්ධ ජයන්තිය සැමරීමේ උත්සවය ද යෙදී තිබුණේ 1956 වසරට ය. එම වසරේ දී මැතිවරණයක් පැවැත්වීම ද බුද්ධ ජයන්ති උත්සවය අවුල් කිරීමට යෙදූ කුමන්ත්‍රණයකි. කෙසේ වුවද සියවස් ගණනක් තිස්සේ ක්‍රිස්තියානි මිෂනාරීන් හා බටහිර ආක්‍රමණිකයන් ඒකාබද්ධව වනසන ලද බෞද්ධ උරුමය, දේශීය අධ්‍යාපනය, ආර්ථිකය, සිංහලයාගේ සිතුම් පැතුම් ආදිය යළිත් ගොඩනැගීමේ අවශ්‍යතාව ගිහි පැවිදි සැමටම ඒ වන විට තදින්ම දැනී තිබිණි. ඒ සඳහා ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවත් වැඩපිළිවෙළක් බෞද්ධ තොරතුරු පරීක්ෂණ සභා වාර්තාවෙන් නිර්දේශ කර තිබිණි. එල්. එච්. මෙත්තානන්ද මහතාගේ ද බලපෑම නිසා එම නිර්දේශ ක්‍රියාත්මක කරන බවට එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා ප්‍රතිඥාවක් දුන්නේය. පංච මහා බලවේගය එක්තැන් වූයේ ඉන් පසුවය. බලයට පත් වූ බණ්ඩාරනායක මහතා අධ්‍යාපන ඇමැතිකම මෙත්තානන්ද මහතාට පැවරීමට සූදානම් වුව ද, ඔහු එයට අකමැති විය. චීනයේ හෝ බුරුමයේ තානාපතිකම ද ඔහු ප්‍රතික්ෂේප කළේය. තමා සියලු කටයුතු කරන්නේ රට, දැය, සමය වෙනුවෙන් මිස තනතුරු බලාගෙන නොවේ යැයි ඔහු අගමැතිවරයාට පැවසීය.

සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත් කිරීම අගමැති බණ්ඩාරනායක මහතාගේ මැතිවරණ පොරොන්දු අතර ප්‍රධාන තැනක් ගත්තේය. වාමාංශික හා අන්තවාදී බලවේග අදත් එම ක්‍රියාව විවේචනය කරයි. නමුත් සිංහල භාෂාවේ ආරක්ෂාවට හා ගම්බද දරුවන්ගේ උසස් අධ්‍යාපනයට එමගින් විශාල යහපතක් සැලසුණි. මැතිවරණ පොරොන්දු ඉටු කිරීමට බණ්ඩාරනායක අගමැතිවරයා වෙහෙස දැරුවද, සිංහල බෞද්ධ විරෝධී බලවේගයන්ට ඔහු යට වූ බවක් ද පෙනේ. සිංහල භාෂාව රාජ්‍ය භාෂාව වශයෙන් ක්‍රියාත්මක කිරීමේදී උදාසීන බවක් දක්නට තිබිණි. ඒ අතර දෙමළ භාෂා විශේෂ විධිවිධාන පනත නමින් පනතක් සම්මත කෙරුණි. මෙත්තානන්ද මහතා ඒ ගැන චෝදනා කරමින්, බණ්ඩාරනායක අගමැති සිංහල ජනතාව රවටන්න යනවා යැයි ලිපියක් ලීවේය.

එම පනත ක්‍රියාත්මක කිරීමේ කාර්යය පැවරෙන්නේ ආණ්ඩුවේ සියලුම දෙපාර්තමේන්තු පාලනය කරන භාණ්ඩාගාරයට ය. බණ්ඩාරනායක මහතා එවකට භාණ්ඩාගාරයේ ලේකම්වරයාව සිටි සිංහලයට හිතැති ඇල්. ජේ . ද එස්. සෙනෙවිරත්න මහතා එම තනතුරෙන් ඉවත් කොට, ඒ වෙනුවට සිංහලයට හාත්පසින්ම විරුද්ධ වූ ද, ෆෙඩරල්වාදීන්ට පක්ෂ වූ ද, ඇස්. ඇෆ්. සමරසිංහ මහතා එම තනතුරට පත් කළේය. ඔහු මෙන්ම ඔහුගේ ප්‍රධානියා වන මුදල් ඇමැති ස්ටැන්ලි ද සොයිසා මහතා ද සිංහල නොදන්නා සිංහල පිළිකුල් කරන බටහිර පන්නයට හැඩ ගැසුනු කෙනෙකි. සිංහල පනත ක්‍රියාත්මක කිරීමේ වැඩපිළිවෙළ මේ දෙදෙනාම එකමුතුව කඩාකප්පල් කරන බව මෙත්තානන්ද මහතා පැවසුවේය.

ෆෙඩරල්වාදීන්ගේ අපේ මිනිසුන් පමණයි යන නම්මඩාල් ප්‍රතිපත්තියට අනුව සෑම ආයතනයකටම දෙමළ පිරිස් බඳවා ගැනීමේ සැලැස්මක් ක්‍රියාත්මක වෙයි. සර් කන්දයියා වෛද්‍යනාදන් මහතා නිවාස ඇමැතිව සිටි කාලයේදී නිවාස දෙපාර්තමේන්තුව දෙමළ නිලධාරීන්ගෙන් පුරවා ගත්තේය. එබැවින් නිවාස සෑදීමට හෝ ඉඩම් මිලේට ගැනීමට හෝ වුවමනා මුදල් දෙමළ අයට ලබා ගැනීමට ඉඩ ලැබිණි. මේ හේතුවෙන් අද දවසේ වැල්ලවත්ත, රත්මලාන, බත්තරමුල්ල, තලංගම ආදී ප්‍රදේශ කුඩා යාපන හැටියට පරිවර්තනය වී තිබේ. තොග වෙළෙඳාම, රජයේ කොන්ත්‍රාත්, මුදල් බලය ආදිය ෆෙඩරල්වාදීන් අතට පත්ව ඇත. ඒ සඳහා රුකුල්දෙන අන්දමට උසස් අධ්‍යාපනය සකස් කිරීමෙන් සිංහල සිසුන්ට අසාධාරණයකි. විශ්වවිද්‍යාල අධ්‍යාපනය දෙමළ භාෂාවෙන් ලබාගන්නවුන් රජයේ සේවාවන්ට දෙමළ භාෂාවෙන් ම ඇතුල් වී දිගින් දිගටම දෙමළ භාෂාවෙන් කටයුතු කරගෙන යෑමට මාන බලනු ඇත. මේ සංඛ්‍යාව අධික වීමට විශේෂ කරුණක් නම් ඔවුන්ට පහසුවෙන් උපාධි ලබා ගත හැකි බවය. කරුණු මෙසේ වෙතොත් සිංහල භාෂාවෙන් රට පාලනය වන්නේ කෙසේ ද?

**අගමැතිවරයාට වචනයක් කියමි. රටේ පරිපාලනය, බැංකු වෙළඳහෙළඳාම්, වතුපිටි, ජනපද, නගර, අධ්‍යාපනය, කම්හල්, මහාමාර්ග, සමාජ සේවා, කොටින් කියතොත් රටේ සියලුම කටයුතු ෆෙඩරල් බලයට යටත් වෙද්දී අපේ අගමැතිවරයා බහුතර ජනතාව වන සිංහලයන්ගේ භාෂාව රටේ කොටසකට රාජ්‍ය භාෂාව වන අන්දමට මහ සැලසීමෙන් ද, සුළු ජනතාව වන දෙමළ අයගේ භාෂාව රට පුරා රාජ්‍ය භාෂාව වන හැටියට නීතිගත කිරීමෙන් ද, සිංහලයන්ගේ අවුරුදු දෙදහසක නෂ්ටාවශේෂයන්ගෙන් පිරී ඉතිරී ගිය තවමත් සිංහලයන් වෙසෙන උතුරු හා නැඟෙනහිර පළාත්වල දෙමළ රාජ්‍යයක් පිහිටුවන්නට ඉඩදීමෙන් අනාථ වූ සිංහල ජනයා ගලවා ගැනීමට ඉඩකඩ වන දේ නොසලකා හැරීමෙන් ද, මහ මැතිවරණයේදී සිංහල ජනතාවට දුන් පොරොන්දු ඉෂ්ට කරන්නට යන්නේ? මෙය සිංහල ජනතාව රැවටීමක් නොවේද?** යි මෙත්තානන්ද මහතා ප්‍රශ්න කර ඇත.

අගමැති බණ්ඩාරනායක මහතා ද, රැස්වීම්වල හා පාර්ලිමේන්තු විවාදවල දී මෙත්තානන්ද මහතාට චෝදනා කර ඇත. **මෙත්තානන්ද මහතා මොනවාදෝ ඩැල්වටාරමක් ලියා තිබෙනවා. සිංහල ළමයින්ට නැති අයිතියක් දෙමළ ළමයින්ට ලැබෙනවා කියා. ඒ සමගම සිංහල ළමයින් ගැන වචනයක්වත් කියා නැහැල්ලු. දෙමළ ළමයින් ගැන පමණක්ලු කියා තිබෙන්නේ. ඇයි ගරු සභාපතිතුමනි, සිංහල භාෂාව රාජ්‍ය භාෂාව නම්, සිංහල ළමයින්ට තියෙන අයිතිය විස්තර ලෙස ප්‍රකශ කරන්න වුවමනා ද? සිංහල භාෂා තත්ත්වයෙන් ම ඒ අයිතිය ලැබෙනවා නේද? එම නිසා මෙත්තානන්ද මහත්තයා ඩේලි නිව්ස් පත්තරයට ලියපු ලිපිය ගැන වැඩිපුර යමක් කියන්නට බලාපොරොත්තු වන්නේ නැහැ.** (1958 අගෝස්තු 5 හැන්සාඩ් වාර්තාව)


මෙත්තානන්ද මහතාගේ අවධානය යොමු වන අනික් කරුණ නම් බෞද්ධයන්ට එරෙහිව විවිධ අංශවල ක්‍රියාත්මක වන ක්‍රිස්තියානි ආක්‍රමණයයි. ඒ සම්බන්ධයෙන් ඔහු ඉදිරිපත් කළ කරුණු රාශියක් 1956 බුද්ධ ශාසන තොරතුරු පරීක්ෂණ වාර්තාවේ ඇතුළත් ය. බෞද්ධ ජාතික බලවේගය මගින් පළ කෙරුණ කතෝලික ආක්‍රමණය Catholic Action පොතේ ද තවත් කරුණු විස්තර වෙයි. එම පොතේ පෙරවදන ඇරඹෙන්නේ මෙසේය.

**මේ ප්‍රකාශනය වූ කලී ජාතිවාදී හෝ ආගමික හෝ භේද මතුකිරීමේ ප්‍රයත්නයක් නොවන බවත්, මෙහි අරමුණ වනුයේ ජාතියේ සමගියටත්, ආරක්ෂාවටත් කතෝලික ආක්‍රමණය නමැති ව්‍යාපාරයෙන් එල්ල වී ඇති තර්ජනය ගැන කල්තියා රටවැසියන්ට දැනුම් දීම බවත්, මේ පොත මහජනතාව අතට පත් කරමින් පැහැදිලි ලෙසම පවසනු කැමැත්තෙමු.**

**"කතෝලික ආක්‍රමණය ආගමේ මුණුබුරුවරින් අවුත් ජනතාවගේ ජීවිතයටත් වැඩ කටයුතුවලටත් හෙමින් සීරුවේ එහෙත් නොකඩවා රිංගා ගෙන ලංකාව විදේශීය බලයක යටත් විජිතයක් කිරීමට විධිවිධාන යොදන අයුරු මේ පොතෙහි එන කරුණුවලින් ද සංඛ්‍යාලේඛනවලින් ද පෙන්වා දී ඇත. අප කල්තියා කරන මේ අනතුරු ඇඟවීම කිතුනු, මුස්ලිම් හා ප්‍රොතෙස්තන්ත, සොහොයුරු සොහොයුරියන් මෙන්ම අපේ කතෝලික සහෝදර, සහෝදරියන් විසින් ද එම ඇඟවුම ඉදිරිපත් කර ඇති නියායෙන් ම අවබෝධ කර ගන්නවා ඇතැයි විශ්වාස කරමු. අප පැමිණිලි කරන්නේ කතෝලික ජනතාවට නොව කතෝලික ආක්‍රමණයට විරුද්ධව බව මෙහිලා අවධාරණයෙන් කියා සිටිය යුතුය."**

ඇතැමුන් නොයෙකුත් අන්දමින් නින්දා කළත්, මෙත්තානන්ද මහතා සිංහලයන් හා බෞද්ධයන් වෙනුවෙන් නිතරම නිවැරැදි මතයක් ඉදිරිපත් කළ කෙනෙකි. ෆෙඩරල්වාදී දෙමළ සහ සිංහල පිරිස රට දෙකට කැඩීමට කටයුතු කරන බව ඔහු පෙන්වා දුනි. ඒ අතර සමාජයේ අස්සක් මුල්ලක් පාසා විහිදෙන ක්‍රිස්තියානි ආක්‍රමණය පිළිබඳව ද ඔහු සඳහන් කළේය. ජාතික හා ආගමික විනාශයන් වළක්වා ගැනීමට ඔහුගෙන් ලැබුණේ සුවිශාල දායකත්වයකි. ෆෙඩරල් ක්‍රමය රට බෙදීමේ කුමන්ත්‍රණය තවමත් නිමා වී නොමැත. එල්. එච්. මෙත්තානන්ද මහතා වැනි දේශප්‍රේමීන් අදත් අපේ දේශයට අවශ්‍ය වන්නේ ඒ නිසාය. 1967 නොවැම්බර් 01 දින සිදුවූ මෙත්තානන්ද මහතාගේ අභාවය නිමිත්තෙන් ලංකාදීප පුවත්පතේ පළ වූ ගුණ කථනයක එන පහත සඳහන් ඡේදයෙන් ඔහුගේ ජීවිතයේ හැඩරුව අපට හඳුනා ගන්නට පුළුවන.


"හිතටත්, හෘදය සාක්ෂියටත් පමණක් නොව, දේශීය හා ජාතික ජීවිතයේ පැහැදිලිව පෙනුන වුවමනාවන්ටත් එකඟ වන සේ ඇත්ත කීමටත්, ඒ කියන ඇත්තට අනුව හැම විටම ක්‍රියා කිරීමටත්. පෙළඹුන මෙත්තානන්දයෝ සිය ව්‍යාපාරයේ එක් උච්ච අවස්ථාවකදී මෙරට ඔටුනු පමණක් නොපලන් අධිරාජයකු බඳු වූහ. ඔහු ලියන වචන මෙන්ම කියන වචන ද නීතියක් විය යුත්තක් විය. ශතවර්ෂ පහක් තිස්සේ මහ පාළු කාන්තාරයක් මෙන් වියළී ගිය අනාථ අසරණ සිංහල ජීවිතය පලබර වන උයනක් වී එහි තැනින් තැන දහස් ගණන් සුවඳැති මල් පිපෙන්නට පටන් ගත්තේ සිංහල බෞද්ධ උරුමයන් සහ අයිතිවාසිකම් නැති වී ගිය තැන් සහ නැති වී ගිය සැටිත් මෙත්තානන්දයන් විසින් මහ හඬින් සවිස්තරව පෙන්වා දුන් විටය.







BACK TO THE ARENA




THE FIRE-FIGHTERS

ඕබ්රි කොලට් විසින් අඳින ලද මෙත්තාන්නදයන් නිරූපිත කාටූන්